*PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 14-Iss. II, Dec. 2023, 13-28.*
*DOI: https://doi.org/10.4038/p.v14i2.44*

# ඉන්ද්‍රිය පිළිබඳ ආභිධම්මික විවරණය (ත්‍රිපිටක මූලාශ්‍රය ඇසුරින්)

## [Ābhidhammika Commentary on Indriya]

**Medagampitiye Wijithadhamma**[1]

**Rajapakshage Chanaka Pradeep Karunarathna**[2]

**Abstract**

The Tipiṭaka presents extensive analyses on the doctrine of the senses (indriya), a distinctive teaching within Buddhism. The term indriya denotes that which governs or exercises control over associated dhammas. Across the canonical texts, various definitions of sensory dhammas are offered, with the Abhidhamma Piṭaka providing the most systematic exposition. The Buddhist understanding of the senses arises in multiple structural contexts, emphasizing both their functional and subjective diversity. Traditionally, the five physical senses are classified in two main ways, and from a psychological standpoint, they are interpreted as modes of cognition. Within the framework of Paṭiccasamuppāda, the individual (satta) is defined through attachment to the five aggregates (pañcakkhandha): form, feeling, perception, volitional formations, and consciousness. In addition to these, five spiritual faculties—faith, energy, mindfulness, concentration, and wisdom—are also designated as indriyas. The Buddha described them as parāpara, signifying their function in differentiating higher and lower spiritual states. Thus, indriya embodies paropariyatta, a principle influencing both worldly and transcendental dimensions of existence. Buddhism, while rejecting mere worldliness, advocates the cultivation of indriya for moral and spiritual development. In the Abhidhamma, this doctrine guides the formation of a Dhamma-oriented society and the realization of true knowledge (yathābhūta-ñāṇadassana). Ultimately, comprehension of the indriya doctrine leads to insight into the aggregates and the attainment of Nibbāna.

**Keywords**: Paṭisotagāmi, Pañcakkhandha, Ubhayārtha Sādhana, Indriya, Caraṇa

1 Senior Professor, Department of Pali and Buddhist Studies, University of Sri Jayewardenepura, Sri Lanka.

2 Assistant Lecturer, Department of Pali and Buddhist Studies, University of Kelaniya, Sri Lanka.

Received: 20 July 2023, Accepted revised version: 20 August 2023.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

## සාරසංක්ෂේපය

ඉන්ද්‍රිය පිළිබඳ දීර්ඝ විවරණ රාශියක් ත්‍රිපිටකයේ අන්තර්ගත වේ. 'ඉන්ද්‍රිය' යනු බුදුදහමේ ඇතුළත් විශේෂ ඉගැන්වීමකි. තමා හා සම්බන්ධ ධර්මයන් කෙරෙහි අධිපතිකම පවත්වන දේ (ධර්මයෝ) ඉන්ද්‍රිය නම් වෙති. ඉන්ද්‍රිය ධර්ම පිළිබඳව නිර්වචන රාශියකි. අභිධර්මයේ පංචස්කන්ධය පිළිබඳ පුළුල් විග්‍රහයක් දක්වා ඇත. ඉන්ද්‍රිය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙහි ව්‍යුහාත්මක සන්දර්භ කිහිපයක් ඇති බව දක්නට ලැබේ. අනෙක් අතට ඒ ඉන්ද්‍රියයන් විෂයයීය වශයෙන් ද විවිධ වේ. පඤ්ච ඉන්ද්‍රිය යන්න දෙපරිදිව විෂයයීය වශයෙන් වෙන් වෙයි. මනෝවිද්‍යාඥයින් ඉන්ද්‍රිය ඥානෝපකරණ අර්ථයෙන් විග්‍රහ කරයි. "රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පංචස්කන්ධයේ ඇලුණු පුද්ගලයා සත්ත හෙවත් සත්ව නම් වෙයි. සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යනුවෙන්ද ඉන්ද්‍රිය පහකි. බුදුරජාණන් වහන්සේ හැඳින්වීම සඳහා "පරොපර" ලෙස හඳුන්වයි. එයට හේතුව සත්වයන්ගේ ඉන්ද්‍රිය තත්වය පිරිසිඳ දැකිය හැකි වීමයි. එය ඉන්ද්‍රිය පරොපරියත්ත ඤාණ යනුවෙන් හැඳින්වේ. පුද්ගලයාගේ ලෞකිකත්ත්වය කෙරෙහි ඍජුව බලපාන සංකල්පයකි ඉන්ද්‍රිය. ඉන්ද්‍රිය පිණවීම මගින් පුද්ගලයා සසර ගමන දිගු කර ගනී. බුදුසමය එය අනුමත නොකරයි. නිර්වාණ සාධනය සඳහා ඉන්ද්‍රීය දමනය අත්‍යාවශ්‍ය සාධකයකි. එම නිසා ඉන්ද්‍රිය කෙරෙහි බුදුසමය දැඩි අවධානයක් යොමු කිරීම සාධාරණය. අභිධර්මයෙහි ඒ පිළිබඳ පුළුල් විග්‍රහයක් එයි. බුදුසමය අපේක්ෂා කරන්නේ ලෞකික ලොකෝත්තර උභයාර්ථ සාධනය අරමුණු කරගත් සමාජයකි. පඤ්චස්කන්ධය යනු සත්ත්වයායි. නූතන මනෝවිද්‍යාවේ ද, අනුසෝතගාමී දර්ශනයක හා චරණයක නිරතුරුව නියුතු වූ ලෝකයා එයින් මුදවා පටිසෝතගාමී දර්ශනයක හා චරණයක පිහිටුවාලමින් සම්මුති හා පරමාර්ථමය වශයෙන් හේතුඵලවාදී පදනම මත පුද්ගලයා සහ ඔහුට සාපේක්ෂක ලෝකය විග්‍රහ කරන බෞද්ධ දර්ශනයෙහි ද විවිධ පුද්ගල වර්ග කිරීම් දක්නට ලැබේ. නාම රූප ධර්මයන් විවිධ වූ ආකාරයෙන් වර්ගීකරණය වන අයුරු මෙහි දී දක්වාලයි. උභය ලෝක සැපයන් ලඟා කර ගැනීමට මෙම යථාභූත ඥාන දර්ශනය හෙවත් ලෝක යථාර්ථය පිළිබඳ පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය. සත්වයාගේ ලෞකික ගැටලු පිළිබඳවත්, සසර පැවැත්ම පිළිබඳවත් හේතුඵල සම්බන්ධතාවය තත්වූ පරිදි දැකීම හෙවත් නිරවද්‍ය යථාර්ථය දැකීම යථාභූත ඥාන දර්ශනය ලෙස හැඳින්වේ. එයම තවත් සරල ලෙස දක්වතොත් පංචස්කන්ධය පිළිබඳ තත් වූ පරිදි දැන ගැනීම යනුවෙනි. නිර්වාණගාමී මාර්ග සාධනයට ඉන්ද්‍රිය දමනය බෙහෙවින් ප්‍රයෝජනවත් වූවකි.

**ප්‍රමුඛ පදඃ-** පටිසෝතගාමී, පංචස්කන්ධය, උභයාර්ථ සාධනය, ඉන්ද්‍රිය, චරණය

## හැඳින්වීම

මෙම ලිපියේ දී ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වනුයේ ඉන්ද්‍රිය පිළිබඳ ආභිධම්මික විවරණය ත්‍රිපිටක මූලාශ්‍ර ඇසුරින් විග්‍රහ කොට දැක්වීමටයි. එහි දී ඉන්ද්‍රිය යනු කුමක් ද? ඉන්ද්‍රිය පිළිබඳව ඇති නිර්වචන මොනවා ද? එහි ඇති වැදගත්කම කවරේ ද? යන්න පළමුව පෙන්වා දෙයි. ඉන්ද්‍රිය පිළිබඳව නිර්වචන රාශියකි. බෞද්ධ හා බෞද්ධ නොවන මූලාශ්‍රයන්හි ඒවා දැකගත හැකි වෙයි. විභඞ්ගප්පකරණ අටුවාව, විභඞ්ගප්පකරණ මූල ටීකාව, ශබ්දකල්පද්‍රැම, වචස්පත්‍යම්, ශබ්දස්තෝමමහානිධි ආදී ග්‍රන්ථ හා විශ්ව කෝෂ, ශබ්ද කෝෂ ආදියෙහි ඒ පිළිබඳ නිර්වචන ඉදිරිපත් වේ. මෙහි දී ඉන්ද්‍රිය විභාගය හා සම්බන්ධ විවිධ ව්‍යුහයන් යටතේ කරුණු ගොනු වේ. ඇස, කණ, නාසය, දිව, ශරීරය යන රූපස්කන්ධය හා සම්බන්ධ ඉන්ද්‍රිය ධර්ම පිළිබඳ කරුණු මෙහි දී සාකච්ඡා වේ. අභිධර්මයේ පංචස්කන්ධය පිළිබඳ පුළුල් විග්‍රහයක් දක්වා ඇති අතර ඒ පිළිබඳ විග්‍රහයක් සිදු කෙරේ.

2012 වර්ෂයේ අභය මුද්‍රණ ශිල්පියෝ විසින් මුද්‍රිත සුමනපාල ගල්මංගාඩ මහතා විසින් රචිත ආදි බෞද්ධ දර්ශනය සුවිශේෂී ග්‍රන්ථයක් වෙයි. එහි සමකාලීන ඥානවාදය, භක්තිවාදය හා සම්බන්ධ තොරතුරු ඇතුළත්ය. ඥානය පිළිබඳ විමංසනයේ දී ඉන්ද්‍රිය ඥානය සුවිශේෂී වූවක් ලෙස පෙන්වාදෙයි.

1994 වර්ෂයේ සම්පාදිත කේ. එම්. ජයතිලකයන්ගේ මුල් බුදුසමයේ ඥාන විභාගය ග්‍රන්ථය සුවිශේෂ වූවකි. එහි පෙර අපර දෙදිග මතවාද රාශියක් අන්තර්ගතය. ආගමික කණ්ඩායම් ඒ ඒ ඥාන විභාගයන් සම්බන්ධව දක්වා ඇති ආකල්ප වේ. එහි ප්‍රත්‍යක්ෂ ඥානය සම්බන්ධ කරුණු රාශියකි. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය හා අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය එහිලා සුවිශේෂ කොට පෙන්වා දෙයි.

1995 වර්ෂයේ හෝමාගම කරුණාරත්න සහ සමාගම විසින් මුද්‍රිත, අසංග තිලකරත්නයන්ගේ අභිධර්ම අධ්‍යයනය ද ඉන්ද්‍රිය පිළිබඳ ආභිධම්මික මතවාද රාශියක් ඉස්මතු කරගත හැකි සුවිශේෂී කෘතියකි. අභිධර්මයේ ඇති සෑම කාරණයක් ම ඉන්ද්‍රිය බද්ධ වූ ඒවා ලෙස විස්තාරිතව ඇති අයුරු මනාව පෙන්වා දී ඇත. පඤ්චින්ද්‍රියන් වැඩෙන අයුරු හා දමනය වන අයුරු මෙහි මනාව පෙන්වා දී ඇත.

2007 වර්ෂයේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත ගුණපාල ධර්මසිරි මහතා විසින් රචිත දාර්ශනික ප්‍රශ්න ග්‍රන්ථය මගින් දාර්ශනික ප්‍රශ්න පෙන්වා දී ඇත. දාර්ශනික ප්‍රශ්න අතර ඉන්ද්‍රිය පිළිබඳව ඇති ගැටලු සුවිශේෂ වෙයි.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය විසින් ප්‍රකාශිත හේන්පිටගෙදර ඤාණසීහ හිමියන් විසින් රචිත බෞද්ධ දර්ශනය ග්‍රන්ථය "ඉන්ද්‍රිය" හා සම්බන්ධ සුවිශේෂී කරුණු ඇතුළත් වූවෙකි. සමස්තයක් ලෙස ගත්කල එහි ඇති සියලුම කාරණා ඉන්ද්‍රිය බද්ධ වූ ඒවා බව පෙනේ. මෙම පර්යේෂණයේ දී තත් ග්‍රන්ථයෙහි ඇතුළත් කරුණු පාදක කොටගත හැකිය. එසේම 1980 වර්ෂයේ වීල් ප්‍රකාශන ආයතනයේ මුද්‍රිත එඩ්වඩ් කොන්සේ විසින් රචිත The way of wisdom: The spiritual faculties යන ග්‍රන්ථය ද ඉන්ද්‍රිය හා සම්බන්ධ ආධ්‍යාත්මික හැකියාවන් හෙළිකරන්නෙකි. මෙමගින් ද පංච ඉන්ද්‍රිය පිළිබඳව දත හැකිය.

1997 වර්ෂයේ ඤාණිස්සරෝ හිමියන් විසින් පරිවර්තනය කරන ලද Indriya vibhaṅga sutta: Analysis of the Mental Faculties යන්න ද ඉන්ද්‍රිය විභංග සූත්‍රය ඇසුරෙන් මානසික ධර්ම විශ්ලේෂණය කරන්නකි. එම ධර්ම අතර පංච ඉන්ද්‍රිය පිළිබඳව කරුණු විශ්ලේෂණය සුවිශේෂය. දීගල්ලේ මහින්ද හිමියන් විසින් රචිත නිර්වාණය හා සදාචාරය යන ග්‍රන්ථය මෙම පර්යේෂණය සඳහා බෙහෙවින් ප්‍රයෝජනවත් වූවකි. නුගේගොඩ දීපානි මුද්‍රණාලය විසින් මුද්‍රිත 1986 වර්ෂයේ සම්පාදිත ග්‍රන්ථයකි.

සම්භාෂා 2002 වර්ෂයේ සම්පාදිත 12 වැනි කලාපය “මුල් බුදුසමයේ එන ඥාන විභාග යේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ” නම් ලිපිය හෙට්ටිමුල්ලේ රාහුල හිමියන් විසින් රචිත වූවකි. මෙය ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ශත සංවත්සර සමරු ශාස්ත්‍රීය සංග්‍රහයෙහි පළවූවෙකි. අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ ප්‍රකාශනයක් ලෙසින් මෙය ප්‍රකාශයට පත් කොට ඇත. මෙහි ඥාන විභාගය සම්බන්ධ යම් යම් කරුණු රාශියක් හෙළි කරයි.

ත්‍රිපිටකාගත මූලාශ්‍රය අතර මජ්ඣිමනිකායෙහි ඇතුළත් ඉන්ද්‍රිය භාවනා සූත්‍රය, මධුපිණ්ඩික සූත්‍රය, මහා වේදල්ල සූත්‍රය හා සංයුක්තනිකායෙහි ඇතුළත් බන්ධ සූත්‍රය, ධම්මචක්කප්පවත්තන සූත්‍රය ආදිය සුවිශේෂ වෙයි. සතිපට්ඨාන සූත්‍රය ද ඉන්ද්‍රිය බද්ධ කාරණාවන් හෙළි කොට දැක්වීමේ දී බෙහෙවින් ප්‍රයෝජනවත් වී ඇති බව පෙනේ.

අනෙකුත් සූත්‍ර ධර්මයන් අතර මේවා ප්‍රමුඛ වෙයි. මේවා බුද්ධ ජයන්ති පුනර් මුද්‍රණයන් වන අතර දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් 2015 වර්ෂයේ දී ප්‍රකාශිත ඒවා වෙයි. මෙම මූලාශ්‍රය මඟින් ඉන්ද්‍රිය හා සම්බන්ධ සුවිශේෂ කරුණු රාශියක් ලබාගත හැකි වෙයි.

රේරුකානේ චන්දවිමල නාහිමියන් විසින් රචිත "අභිධර්ම මාර්ගය" ග්‍රන්ථය ද සුවිශේෂ වටිනාකමකින් යුක්ත ග්‍රන්ථයකි. මෙය පංචස්කන්ධය පිළිබඳ බෞද්ධ විග්‍රහයෙහි ආභිධම්මික මතවාද ඇතුළත්ය. මෙය ගැඹුරු ලෙස කරුණු හුවා දක්වන්නකි. 1958 වර්ෂයේ දී බොරලැස්ගමුවේ ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ විසින් මුද්‍රිත ග්‍රන්ථයකි. මෙය ආභිධම්මික මතවාද හුවා දැක්වීමට ඇති අල්ප වූ ග්‍රන්ථ අතුරින් වටිනා ග්‍රන්ථයකි.

**පර්යේෂණ ගැටලුව**

ඉන්ද්‍රිය පිළිබඳ ඉගැන්වෙන ආභිධම්මික විවරණ මොනවා ද? යන්න අධ්‍යයනයයි.

**පර්යේෂණ අරමුණු**

මෙහි පර්යේෂණ මාතෘකාව වනුයේ ඉන්ද්‍රිය පිළිබඳ ආභිධම්මික විවරණය ත්‍රිපිටක මූලාශ්‍රය ඇසුරින් අධ්‍යයනය කිරීමයි. ඒ අනුව මෙම පර්යේෂණ පිළිබඳව පුළුල් අවබෝධයක් ලැබේ. පර්යේෂණය ප්‍රමුඛ වශයෙන් කොටස් දෙකකින් යුක්තය. එනම්, ප්‍රමාණාත්මක පර්යේෂණ හා ගුණාත්මක පර්යේෂණ වශයෙනි. මෙහි දී එම දෙකෙහි ම සංයෝගයක් දැකගත හැකිය. මෙහි දී ඉන්ද්‍රිය පිළිබඳ වචනාර්ථ විග්‍රහයක් සිදු වේ. එසේ ම ඉන්ද්‍රියෙහි ස්වභාවය හා ස්වරූපය කෙසේ ද? ඉන්ද්‍රිය පිළිබඳව ඇති නිර්වචන මොනවා ද? යන්න මැනවින් අධ්‍යයනය කළ හැකිය. ඉන්ද්‍රිය පිළිබඳව එන ආභිධම්මික විවරණයන් ඒ අතර සුවිශේෂ වේ. විභඞ්ගප්පකරණ අටුවාව, විභඞ්ගප්පකරණ මූල ටීකාව මෙහි දී ප්‍රධාන වෙයි. අභිධර්ම පිටකයෙහි ද මේ හා සම්බන්ධ කරුණු රාශියකි. ඒ අනුව මෙම පර්යේෂණය මගින් පාඨකයාට ඉන්ද්‍රිය හා සම්බන්ධ බෞද්ධ ඉගැන්වීම් මැනවින් අධ්‍යයනය කළ හැකිය.

**පර්යේෂණ ක්‍රමවේදය**

පර්යේෂණ මගින් ඉටුකරන ප්‍රධාන කර්තව්‍යයක් වන්නේ පවත්නා දැනුමට නව දැනුමක් එකතු කිරීමයි. කිසිත් නොදන්නා දෙයක් පිළිබඳව, විශ්වාසදායී, වලංගුතාවෙන් වඩා වටිනාකමකින් යුත්, ඔප්පු කළ හැකි, අවබෝධයක් ඇති කළ හැකි වැඩදායී අර්ථයක් ලබාදෙන දෙයක් ලෙස නව දැනුමක් ලෙස ඉදිරිපත් කළ හැක්කේ පර්යේෂණ මගිනි. න්‍යායාත්මක හෝ විෂයයීය නව දැනුමක් ලැබිය හැකි භාණ්ඩයන්, උපකරණයන් හෝ ශිල්ප ක්‍රමයන් අලුතෙන් සොයාගැනීම නිර්මාණයක් හෙවත් පර්යේෂණයක් වෙයි. පර්යේෂණ ක්‍රම යනු ප්‍රධාන වශයෙන් පර්යේෂණ ගැටලුවක ස්වභාවය සහ එය නිරාකරණය කිරීමේ මූලික පදනම හෙවත් කල්වේලා ඇතිවම ඉතා විද්‍යානුකූල ලෙස තීරණය කරගන්නා වූ පර්යේෂණ පද්ධතියක් (Research System) ලෙස හැඳින්වීම වඩා නිවැරදි වේ. පර්යේෂණයේ දී මූලික වන්නේ පර්යේෂණ ගැටළුවයි. මෙහි පර්යේෂණ ගැටළුව වනුයේ ඉන්ද්‍රිය පිළිබඳ ඉගැන්වෙන ආභිධම්මික විවරණ මොනවා ද? යන්න අධ්‍යයනයයි.

මුල් බුද්ධ වචනය වූ ත්‍රිපිටකාගත ඉගැන්වීම් පාදක කොටගෙන ප්‍රධාන කරුණ වූ ඉන්ද්‍රිය පිළිබඳව සාකච්ඡා කිරීම මෙම පර්යේෂණයේ ප්‍රමුඛ අරමුණ වෙයි. මූලික වශයෙන් ලිඛිත මූලාශ්‍ර පාදක කොටගෙන මෙම පර්යේෂණය සිදුකෙරේ. ප්‍රාථමික මූලාශ්‍රය ප්‍රධාන වශයෙන් මූලාධාර කරගනු ලැබේ. අභිධර්ම පිටකාගත ග්‍රන්ථ ප්‍රධාන වශයෙන් පර්යේෂණයට මූලාධාර කොටගනු ලැබේ. ත්‍රිපිටකයත් එහි විස්තරාර්ථකථන ඇතුළත් අටුවා, ටීකා ආදී ග්‍රන්ථ හා පර්යේෂණ මාතෘකාවට අදාළ කරුණු ඇතුළත් සූත්‍ර දේශනා මූලාශ්‍රය ලෙස භාවිත කෙරේ. එයට අමතරව මූලික තේමාවට අදාළව ලියවී ඇති ද්විතීයික මූලාශ්‍රය ද භාවිත කිරීමට අපේක්ෂිතය.

මූලාශ්‍ර භාවිතය සඳහා පුස්තකාල පරිහරණය කරන අතර අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට අන්තර්ජාලය ද පරිහරණය කෙරේ. තවද, මේ සම්බන්ධයෙන් ප්‍රාමාණික දැනුමක් සහිත විද්වතුන් ඇසුරු කොට කරුණු දැන ගැනීමට අපේක්ෂිතය. ප්‍රධාන වශයෙන් ගුණාත්මක ක්‍රමවේදය යොදා ගැනේ. මූලික තොරතුරු දැනගැනීම සඳහා ප්‍රමාණාත්මක ක්‍රමවේදය භාවිත කෙරේ. ගුණාත්මක දත්ත තේමාකරණය තුළිනුත් ප්‍රමාණාත්මක දත්ත කේතගත කිරීම මගිනුත් විශ්ලේෂණය කෙරේ.

**පර්යේෂණයේ වැදගත්කම**

මෙම පර්යේෂණය අධ්‍යයනය මගින් අපට ලබාගත හැකි ප්‍රයෝජන රාශියකි. ඒවා නම්,

01. බුදුදහමේ දැක්වෙන මූලික සංකල්පයක් වන ඉන්ද්‍රිය පිළිබඳව අධ්‍යයනය කළ හැකි වීම

02. ඉන්ද්‍රිය පිළිබඳව එන ශබ්දකෝෂ, විශ්වකෝෂ සහ අනෙකුත් ග්‍රන්ථයන්හි එන අර්ථ විවරණ සහ නිර්වචන අධ්‍යයනය කළ හැකි වීම

03. ඉන්ද්‍රිය යනු කුමක්ද ? ඉන්ද්‍රිය සම්බන්ධව ඇති ප්‍රභේද මොනවාදැයි අධ්‍යයනය කළ හැකි වීම

04. ඉන්ද්‍රිය පිළිබඳව අන්‍යාගමිකයන් දක්වන ආකල්පය කුමක් ද යන්න දැනගත හැකිවීම

05. ඉන්ද්‍රිය බුදුදහමේ එන සංකල්ප හා සමග සම්බන්ධ වන්නේ කෙසේ ද යන්න දැනගත හැකිවීම

06. ඉන්ද්‍රිය පිළිබඳව එන ආභිධම්මික ඉගැන්වීම් මොනවා ද යන අවබෝධය

07. ඉන්ද්‍රිය නිර්වාණගාමී මාර්ගයට සම්බන්ධ වන්නේ කෙසේ ද ඒ තුළින් නිවන සාක්ෂාත් කරන්නේ කෙසේ ද යන්න දත හැකිවීම

**සාකච්ඡාව**

**ඉන්ද්‍රිය පිළිබඳ අර්ථ විග්‍රහය**

'ඉන්ද්‍රිය' යනු බුදුදහමේ ඇතුළත් විශේෂ ඉගැන්වීමකි. තමා හා සම්බන්ධ ධර්මයන් කෙරෙහි අධිපතිකම පවත්වන දේ (ධර්මයෝ) ඉන්ද්‍රිය නම් වෙති. අධිපතිකම පැවැත්වීම යනු තමාට අනුකූල කරවා ගැනීම ය. බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වලින් නිර්දේශිත පරම නිෂ්ඨාව වන නිර්වාණය අවබෝධ කිරීම සඳහා ඉන්ද්‍රිය සංවරය නැතහොත් දමනය අත්‍යවශ්‍ය වෙයි. එමෙන්ම ඒ සඳහා සංවර්ධනය කරගත යුතු ඉන්ද්‍රිය ද වේ. දමනය කළ යුත්තේ චක්ඛු (ඇස), සෝත (කන), ඝාණ (නාසය), ජිව්හා (දිව), කාය (ශරීරය), මන (සිත) යන ඉන්ද්‍රිය හය යි. වැඩිය යුත්තේ සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රියයන් ය. මේ සියල්ල ද ඇතුළත්ව ඉන්ද්‍රිය විසි දෙකක් වේ. චක්ඛුන්ද්‍රිය, සෝතින්ද්‍රිය, ඝාණින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය, මනින්ද්‍රිය, සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සෝමනස්සින්ද්‍රිය, දෝමනස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය, සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය, අඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය, අඤ්ඤාතාවින්ද්‍රිය වශයෙනි.

ඉන්ද්‍රිය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙහි ව්‍යුහාත්මක සන්දර්භ කිහිපයක් ඇති බව පෙනේ. අනෙක් අතට ඒ ඉන්ද්‍රියයන් විෂයයීය වශයෙන් ද විවිධ වේ. පඤ්ච ඉන්ද්‍රිය යන්න දෙපරිදිව විෂයයීය වශයෙන් වෙන් වෙයි. චක්ඛුන්ද්‍රිය, සෝතින්ද්‍රිය, ඝාණින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය යන පස සේ ම සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන පස ද පඤ්ච ඉන්ද්‍රිය ම වේ. වෛද කාලීන ආගමික සංකල්පයන් වන ඊශ්වරවාචක ඉන්ද්‍ර සංකල්පය ඇසුරින් නිපන් ඉන්ද්‍රිය ශබ්දය පශ්චාත් කාලීන භාරතීය ඥාන මීමංසාවේ දී විශේෂ අවධානයට පාත්‍ර වී ඇත. ශබ්ද කල්පද්‍රැමය, ශබ්දස්තොමමහානිධිය, වචස්පත්‍යම් ආදී සංස්කෘත ශබ්දකෝෂයන්ගේත්, පාලි, සිංහල, ඉංග්‍රීසි, ශබ්දකෝෂ හා විශ්වකෝෂයන්හි ඉන්ද්‍රිය විවිධ ලෙස අර්ථකථනය වේ. පාලියෙහි "ඉන්ද්‍රිය" ලෙසම භාවිත වී ඇත. භාෂා තුනම ඉන්දු ආර්ය භාෂා පවුලට අයත්

වන නිසා සමාන උපයුක්ත යෙදුම් වෙයි. ඉංග්‍රීසි භාෂාවෙහි Sense, Facults, Organ ලෙස යෙදේ. වෛදික ආගමික ඉගැන්වීම් අනුව සියලු දෙයෙහි නිර්මාපකයා ඉන්ද්‍ර දෙවියාය. වෛදික හා බ්‍රාහ්මණ සාහිත්‍ය තුළ ඉන්ද්‍රිය සංකල්පය ආත්මය පිළිබඳ දැනුම පහළ කරවන ඥානෝපකරණයක් වශයෙන් ව්‍යවහාර වේ. උපනිශද් සාහිත්‍ය ඉන්ද්‍රිය සංකල්පය කර්මේන්ද්‍රිය ඥානේන්ද්‍රිය වශයෙන් ඉන්ද්‍රිය දහයක් ලෙස වර්ගීකරණයකට ලක්කොට ඇත. න්‍යාය, වෛශේෂික, සාංඛ්‍ය, යෝග, මීමංසා, වේදාන්ත, ජෛන ආදී භාරතීය දර්ශනයන් අතර ඉන්ද්‍රිය සංකල්පය විවිධාකාරව දක්වයි. සියලු දර්ශනයන් අතර බටහිර දර්ශනයේ ඉන්ද්‍රිය වෙනස්ම අයුරකින් දක්වයි. අන්‍ය දර්ශනයන්හි ඉන්ද්‍රිය සංකල්පය ඒකාංශිකව විග්‍රහ කොට ඇති නමුත් බුදුසමයෙහි දක්වෙන්නේ ඉන්ද්‍රිය සංකල්පයේ පරිණත අවස්ථාවකි. මනෝවිද්‍යාඥයින් ඉන්ද්‍රිය ඥානෝපකරණ අර්ථයෙන් විග්‍රහ කරයි. "රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ'' යන පංචස්කන්ධයේ ඇලුණු පුද්ගලයා සත්ත හෙවත් සත්ව නම් වෙයි.

පුද්ගලයාගේ ලෞකිකත්ත්වය කෙරෙහි සෘජුව බලපාන සංකල්පයකි ඉන්ද්‍රිය. ඉන්ද්‍රිය පිණවීම මගින් පුද්ගලයා ලෞකික දියුණුව සලසා ගනී. බුදුසමය එය අනුමත නොකරන බවක් පෙනී යයි. නිර්වාණ සාධනය සඳහා ඉන්ද්‍රිය දමනය අත්‍යාවශ්‍ය සාධකයකි. එමනිසා ඉන්ද්‍රිය කෙරෙහි බුදුසමය දැඩි අවධානයක් යොමු කිරීම සාධාරණය. බුදුසමයෙන් අපේක්ෂා කරන්නේ ලෞකික, ලොකෝත්තර උභයාර්ථ සාධනය අරමුණු කරගත් සමාජයකි. පඤ්චස්කන්ධය යනු සත්ත්වයායි. එය ස්කන්ධ න්‍යායයි. එනම්, රූපස්කන්ධ, වේදනාස්කන්ධ, සඤ්ඤාස්කන්ධ, සංඛාරස්කන්ධ, විඤ්ඤාණස්කන්ධ වශයෙන් ස්කන්ධ පහකි. පුද්ගලයා නිර්මාණය වී ඇත්තේ ස්කන්ධ පහක එකතුවකිනි. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යනු ස්කන්ධ පහයි. යථාභූත ඥානය පුද්ගලයාගේ ඇස, කන නාසාදී ඉඳුරන් මගින් මෙන්ම ලෞකික ඉන්ද්‍රිය ඥානය ඉක්මවා ගිය අතින්ද්‍රිය ඥාන ශක්තියක් මගින් ද අවබෝධ කොටගත හැකිය. පුද්ගලයා වශයෙන් හඳුන්වනුයේ ස්කන්ධ පසෙහි එකතුවටයි.

ජීවීන්ගේ චර්යාව හා මානසික ක්‍රියාකාරීත්වය පිළිබඳව නිරීක්ෂණය කරනු ලබන විද්‍යාත්මක හා වාස්තවික අධ්‍යයනයක් නූතන මනෝ විද්‍යාවේ ද, අනුසෝතගාමී දර්ශනයක හා චරණයක නිරතුරුව නියුතු වූ ලෝකයා එයින් මුදවා පටිසෝතගාමී දර්ශනයක හා චරණයක පිහිටුවාලමින් සම්මුති හා පරමාර්ථමය වශයෙන් හේතුඵලවාදී පදනම මත පුද්ගලයා සහ ඔහුට සාපේක්ෂක ලෝකය විග්‍රහ කරන බෞද්ධ දර්ශනයෙහි ද විවිධ පුද්ගල වර්ග කිරීම් දක්නට ලැබේ. තමා හා සම්බන්ධ ධර්මයන් කෙරෙහි අධිපතිකම පවත්වන ධර්මයෝ ඉන්ද්‍රිය නම් වෙති. අධිපතිකම පැවැත්වීම යනු තමාට අනුකූල කරවා ගැනීමය. චක්ෂුරාදී ධර්මයෝ තමා හා සම්බන්ධ කරන බැවින් "ඉන්ද්‍රිය" නම් වෙති. පරමාර්ථ ධර්ම පසු යුගයේ දී අභිධර්මය තුළ පරමාර්ථ විශ්ලේෂණයක් ලෙස පරිවර්තනය වී ඇත.

නාම රූප ධර්මයන් විවිධ වූ ආකාරයෙන් වර්ගීකරණය වන අයුරු මෙහි දී දක්වාලයි. ලෞකික සහ ලෝකෝත්තර සැප යන උභය සැපයන් ලඟා කර ගැනීමට මෙම යථාභූත ඥාන දර්ශනය හෙවත් ලෝක යථාර්ථය පිළිබඳ පැහැදිලි අවබෝධයක් තිබිය යුතු බවයි. සත්වයාගේ ලෞකික ගැටලු පිළිබඳවත්, සසර පැවැත්ම පිළිබඳවත් හේතුඵල සම්බන්ධතාවය තත්වූ පරිදි දැකීම හෙවත් නිරවද්‍ය යථාර්ථය දැකීම හෙවත් නිවන යථාභූත ඥාන දර්ශනය ලෙස හැඳින්වේ. එයම තවත් සරල ලෙස දක්වතොත් පංචස්කන්ධය පිළිබඳ තත් වූ පරිදි දැන ගැනීම යනුවෙනි. නිර්වාණගාමී මාර්ග සාධනයට ඉන්ද්‍රිය බෙහෙවින් ප්‍රයෝජනවත් වෙයි. ඒ පිළිබඳව පුළුල් විග්‍රහයක් මෙහි දී එයි.

**ඉන්ද්‍රිය පිළිබඳ ආභිධම්මික මතය**

ඉන්ද්‍රිය ඥානයට ගෝචර වන ලෝකය හෙවත් අපගේ අනුභූතියට ගෝචර වන ධර්මයෝ "ධම්මා" නමින් හඳුන්වනු ලබයි. නාමධම්ම හා රූපධම්ම යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකි. ප්‍රඥාව ලබාගැනීමේ මූලික පදනම ඉන්ද්‍රිය ඥානයයි. ප්‍රඥාව අතීන්ද්‍රිය ඥානයෙහි සංවර්ධිත අවස්ථාව වෙයි. (මහින්ද හේරත්, 2007: 48) පංච ඉන්ද්‍රියන් වන ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන ආයතන සය මගින් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ධර්ම පිළිබඳව ලබන ඥානය ඉන්ද්‍රිය ඥානය ලෙසින් හැඳින්වේ. ඥාන මාර්ග අතර එක් අවස්ථාවක් ලෙස අනුභූතිවාදී ඥාන මාර්ගය පෙන්වා දෙයි. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය තුළින් ඥානය ඇතිවන බවට පිළිගෙන ඇති ඥාන මාර්ගය අනුභූතිවාදය නම් වේ. ධර්මයන්ගේ යථා ස්වභාවය මැනවින් අවබෝධ කොට ගැනීමට එක් එක් ධර්මයන් වෙන් වෙන් වශයෙන් ගෙන සියලු සම්බන්ධතා පිළිබඳ බෞද්ධ දර්ශනයෙහි සෑම අංශයකින්ම සලකා බලා තේරුම් ගත යුතුය. අභිධර්මය පශ්චාත් කාලීන බව බොහෝ දෙනාගේ මතයයි. ආභිධම්මික ඉගැන්වීම්වලට අනුව බුද්ධ දේශනාව ප්‍රධාන ප්‍රභේද දෙකකින් යුක්තය. එනම් සම්මුති සත්‍යය හා පරමාර්ථ සත්‍යය ලෙසින් දැක්වෙයි. සුමංගල විලාසිනියේ ඒ බව මෙලෙස දක්වයි

.... බුද්ධානං පන ද්වේ කථා සම්මුති කථා ච පරමත්ථ කථා ච තත්ථ සත්තො පොසෙවා දෙවො බ්‍රහ්මාති ආදිකා සම්මුති කථා නාම අනිච්චං දුක්ඛමනත්තා ඛන්ධා ධාතුයො ආයතනානි සතිපට්ඨානා සම්මප්පධානාති ආදිකා පරමත්ථකථා නාම.... (දීඝනිකාය අට්ඨකථාව II, 1918, 251)

ලෝක සම්මත භාෂාව භාවිතයෙන් දේශිත දේශනා සම්මුති කථා නම් වෙයි. ලෝකයේ පවත්නා ජීවී, අජීවී සියල්ල සත්ව, පුද්ගල, දිව්‍ය, බ්‍රහ්ම වශයෙන් සම්මත භාෂාව ඔස්සේ නම් කරනු ලබයි. පරමත්ථ කථාවන්හි අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ආදී සංකල්ප ස්කන්ධායතන, ධාතු විභාග ඔස්සේ තහවුරු කිරීමට කරුණු දක්වයි. සූත්‍ර සහ විනය පිටකයන්හි සම්මුති කථා ශෛලිය භාවිත වේ. අභිධම්ම පිටකය සඳහා පරමත්ථ කථා ශෛලිය භාවිතා වේ. අභිධර්ම පිටකයේ ඉන්ද්‍රියානුභූතික ලෝකය නාමරූප ධර්ම වශයෙන් හඳුනාගනී. එහිදී චිත්ත, චෛතසික යන පරමාර්ථද්වය නාම ධර්ම කොටසට ද රූප පරමාර්ථ රූප ධර්ම කොටසට ද ගනී. අභිධර්ම පිටකය යනු නාමරූප ධර්ම පිළිබඳ කතිකා කෙරෙන පරමත්ථ දේශනාවක් ලෙස පෙන්වා දිය හැකිය. ථෙරවාද, සර්වාස්තිවාද වැනි ආගමික සම්ප්‍රදායයන් අභිධර්මය පිළිගනී. සෞත්‍රාන්තික සම්ප්‍රදාය අභිධර්මය බැහැර කරන නමුදු විවිධ ධර්ම වර්ගීකරණ භාවිතා කරමින් යථාභූත ස්වරූපය විස්තර කිරීමට උත්සාහ ගෙන ඇති බව පෙනේ.

අභිධර්ම පිටකයේ විෂය ක්ෂේත්‍රය වනුයේ නාම සහ රූප ධර්ම දෙකොටසකට බෙදෙන සාධකයන්ට නිර්වචන දැක්වීම සහ වර්ගීකරණයන්ය. අන්තර් සබඳතා විස්තර කිරීම අභිධර්ම පිටකයේ විෂය ක්ෂේත්‍රය වෙයි. අභිධර්ම පිටකාගත ග්‍රන්ථ තුන අධ්‍යයනයෙන් මෙහි දීර්ඝ වශයෙන් දක්නට ලැබෙනුයේ ධර්ම නාමාවලී දැක්වීම සහ වර්ගීකරණයන්ය. ධර්මයන්ගේ ඒ ඒ ලක්ෂණ වෙන්ව අන්‍යොන්‍ය සම්බන්ධය දැක්වීම ද මෙහි සිදු වෙයි. ධර්ම වර්ගීකරණයේ දී භාවිත විශ්ලේෂණ ක්‍රම දෙකක් අභිධර්ම පිටකයේ දැක්වෙයි. එනම් විශ්ලේෂණ න්‍යාය සහ සංශ්ලේෂණ න්‍යායයි. ධම්මසංගණිය විශ්ලේෂණාත්මකව දක්වයි. එනමුදු පට්ඨාන ප්‍රකරණයේ සංශ්ලේෂණයට ද නැඹුරුව ඇති බව පෙනේ. එමගින් ධර්මයන්ගේ අන්‍යොන්‍ය සම්බන්ධය මැනවින් ප්‍රත්‍යක්ෂ කරගත හැකිය. විශ්ලේෂණය මගින් ධර්ම බාහුත්වයක් බවට බෙදා දක්වන අතර සංශ්ලේෂණය මගින් අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධව පවත්නා සාධක රැසක් විස්තාරිත වේ. පුද්ගලවාදීන්, "අනිත්‍ය වූ නාමරූප ධර්මයන්ට අමතරව නිත්‍ය වූ පුද්ගල පදාර්ථයන් ඇත." යන්න හඳුන්වා දෙන ලදි. එහිදී සත්‍ය ලෙස ම

පරමාර්ථ වශයෙන් පුද්ගලයෙකු දක්නට ලැබෙන බව සඳහන් වෙයි. ථෙරවාදීන්ට අනුව නාමරූප ධර්ම පරම්පරාව සච්චිකට්ඨ පරමත්ථ වශයෙන් වෙසෙසා දැක්විය හැකි නමුත් පුග්ගල පඤ්ඤත්තිය එලෙස පැණවිය හැකි නොවෙයි. (කථාවත්ථුප්පකරණය, 1)

01. විශ්ලේෂණයට භාජනය කළ හැකි දෑ

02. විශ්ලේෂණයට භාජනය කළ නොහැකි දෑ

මෙහි දී සංයුක්ත වස්තූන් විශ්ලේෂණ ස්වභාවය කොට ඇති අතර පරමාර්ථ ධර්ම අවිශ්ලේෂණීය ස්වභාව කොට ඇත. සර්වාස්තිවාදය ථෙරවාදීන් බැහැර කරන නමුත් එය ධර්මවාදයට බාධාවක් නොවේ. "ධම්ම" යන්න හැඳින්වීමට ස්වභාව යන වචනය ථෙරවාදයට පැමිණෙන්නේ සර්වස්තිවාදයෙහි බලපෑමෙනි. අටුවාවෙහි "ධම්ම" යන්න, "අත්තනෝ සභාවං ධාරෙන්තීති ධම්මා" (මජ්ඣිමනිකාය අටුවාව, 1933: 11) යනුවෙන් විස්තර කරයි. තමාගේ ස්වභාවය දරන බැවින් ධම්ම නම් වේ. නාම රූප ධර්ම විග්‍රහ කිරීම සඳහා ආභිධර්මිකයන් භාවිත ක්‍රම තුනකි.

01. කත්තු සාධන

02. කරණ සාධන

03. භාව සාධන

යමක් නිර්වචනය කිරීමේ දී එයට කර්තෘ අර්ථයක් ආරෝපණය කෙරේ නම් එය කත්තු සාධන නම් වේ. එසේම යමක් නිර්වචනය කිරීමේ දී එයට උපකරණ අර්ථයක් ආරෝපණය කෙරේ නම් එය කරණ සාධන නම් වේ. එසේ ම යමක් නිර්වචනය කිරීමේ දී එයට භාවාර්ථයක් හෙවත් වියුක්ත ස්වභාවයන් ආරෝපණය කෙරේ නම් එය භාව සාධන නම් වෙයි. කත්තු සාධන සහ භාව සාධන යොදාගනුයේ විවරණයේ පහසුව සලකා ගෙනය.

යමක් නිවැරදිව කිරීම සඳහා වඩාත් උචිත ක්‍රමය භාව සාධනයයි. ධර්මයක වියුක්ත ස්වභාවය මත කිරීමේ ශක්‍යතාව ඇත්තේ භාව සාධන ක්‍රමයට පමණි. එහි දී කර්තෘත්වය හෝ කරණත්වය භාවිතා නොවේ. කත්තු සාධන ක්‍රමය "තමාගේ ස්වභාවය දරන බැවින් ධර්ම නම් වේ යන්න තේරුම් ගැනීමේ පහසුව හෙවත් විස්තර කිරීමේ පහසුව සඳහා යොදගත් බව තේරුම් ගැනීමට වැදගත් වේ. ධර්ම සහ ස්වභාව යනු එකකි. එය ආරෝපණයක් පමණි. සත් පාදාර්ථයන් ලෙස ධම්ම යන්න වැරදියට වටහා ගත හැකි බැවින් අට්ඨකථාකරුවන් එය නිවැරදි කිරීමේ අදහසින් විවිධ අර්ථකථන දක්වා ඇත. "අත්තනො පන සභාවං ධාරෙන්තීති ධම්මා. ධාරියන්ති වා පච්චයෙහි. ධාරියන්ති වා යථාස්වභාව හොති ධම්මා" (ධම්මසංගණී අටුවාව, 1940: 63) ධම්මසංගණ මූල ටීකාවෙහි, "නව දාරියෙ මාන සභාවා අත්ථො ධම්මෝ නාම අත්ථි" (ධම්මසංගණී අටුවාව, 1940: 63).

ධර්මය යනු තමාගේ ස්වභාවය දරන දෙය නොව ප්‍රත්‍යයන් විසින් දරනු ලබන දෙයයි. තව ද අන්‍යයන් විසින් දරනු ලැබීමේ ස්වභාව හැර ධර්ම නමින් වෙනත් දෙයක් නොවන බව ද අවධාරණය කොට ඇත. පටිසම්භිදාමග්ගයේ දී පංචස්කන්ධය ශූන්‍ය බව විග්‍රහ කරයි. එයට අට්ඨකථා සපයන අටුවාචාරීන් වහන්සේලා තමාගේම වූ ස්වභාවයක් නොවන නිසා ස්වභාව ශූන්‍ය වන බව සඳහන් කරයි. "අත්තනෝ එව වා භාවො එතස්මිං නත්ථීති සභාවේන සුඤ්ඤං" (පරමත්ථ අටුවාව, 2013: 460) ධර්මය හැඳින්වීමට භාවිත සභාව යන වචනය සර්වාස්තිවාදීන් භාවිතා කළ අර්ථයෙන් නොව ථෙරවාදීන් ධර්ම යන්නට පර්යාය වචනයක් ලෙස යොදා ඇති බව පැහැදිලි වේ. ධර්ම යන්නට පරමත්ථ යන පදය භාවිතා වන්නේ ඒවා තවදුරටත් බෙදා දැක්විය නොහැකි අවසානික ප්‍රවෘත්ති ඒකකය හෙවත් පරමාර්ථය වන බැවිනි. මෙම නිසා ම සභාව යන්න පරමත්ථ සභාව වශයෙන් ද භාවිතා වෙයි. සම්මුතිය හෝ ශ්‍රැතිය පදනම් කරගෙන නාමරූප

ධර්මයන්ගේ නොපවත්නා බවත් ඒ සඳහා ධර්මවල ස්වායත්ත ස්වභාවය තහවුරු වන බවත් විග්‍රහ වේ. විසුද්ධි මාර්ගයෙහි, "ධර්මය වූ කලී විදර්ශනා ඇසින් පරීක්ෂා කරන්නෙකු මායාවක් සේ නො මඟ නො යවන, මිරිඟුවක් සේ මුලා නොකරන, අන්‍ය තීර්ථකයන්ට ආත්මය මෙන් අනුපලබ්භියමාන නොවන යථාර්ථවත් අසථමුද්ගත යථා භූතය වශයෙන් සම්‍යක් ඥානයෙහි ගෝචර වන්නකි." (විශුද්ධි මාර්ගය II: 533) ථෙරවාදීන්ගේ පරමාර්ථ යන වචනයෙහි ද්‍රව්‍යවාදී හෝ ශාස්තෲවාදී අදහස් ජනිත නොවෙයි. පරමාර්ථ යන වචනයෙහි භාවිත එකම අර්ථය වනුයේ නාමරූප ධර්ම මගින් ආනුභූතික ලෝකය පිළිබඳ ආභිධම්මික විශ්ලේෂණයෙහි අවසන් කඩඉමය. පරමාර්ථ වශයෙන් නාමරූප ධර්ම වෙන් කළ ද නාම සංයුක්තයක හෝ රූප සංයුත්තයක ධර්ම සංසටක එකිනෙක වෙන්කළ හැකි නොවේ. එය මුල් බුදු සමයේ එලෙසම පිළිගෙන ඇත.

"යා චාවුසො වේදනා යා ච සඤ්ඤා යඤ්ච විඤ්ඤාණං ඉමෙ ධම්මා සංසට්ඨා කො විසංසට්ඨා. න ච ලම්භා ඉමෙසං ධම්මානං විනිබ්භුජ්ජිත්‍වා නහාපෙතං වා පඤ්ඤාපෙතුං" (මජ්ඣිමනිකාය I: 688)

මජ්ඣිමනිකායේ මහා වේදල්ල සූත්‍රයෙහි එන මහා කොට්ඨිත හිමියන් සැරියුත් හිමියන්ගෙන් විවිධ ප්‍රශ්න පවසයි. එහි එක් පැනයක් වූයේ වේදනා, සංඥා සහ විඤ්ඤාණ යන ධර්මයන් වෙන් වෙන් කොට වෙනස පණවන්නට හැකිවේද යන්නයි. එයට සැරියුත් හිමියන් ඉහත ආකාරයෙන් පෙන්වාදෙයි. එනම් වේදනා, සංඥා සහ විඤ්ඤාණ යන නාම ධර්ම මැනවින් එකට බැඳී පවතින බවත් වෙන්කළ නොහැකි බවත් ය. මිළිඳු නාගසේන කතා පුවතේ දී මිළිඳු රජු නාගසේන හිමියන්ගෙන් විමසන්නේ එක්ව පවතින චෛතසික වෙන්කළ නොහැකි ද යන්නයි. එහි දී පෙන්වා දෙන්නේ සූපයක් සෑදීමට භාවිත කුළුබඩු ආදිය නැවත වෙන්කළ නොහැකි වා සේම චිත්ත චෛතසිකයන් ද වෙන්කළ නොහැකි බවයි. (ආනන්ද මෛත්‍රිය හිමි, 1962: 58-59) මෙමගින් ප්‍රකට වනුයේ නාම ධර්ම සංඛ්‍යාත චෛතසිකයන් අන්‍යොන්‍ය වශයෙන් වෙන් කළ නොහැකි සේ එකිනෙකට බැඳී පවතින බවයි.

අත්ථසාලිනී අටුවාවේ රූප ධර්ම මූලිකව වෙන් වෙන් කොට දැක්විය නොහැකි බව දක්වයි. රූප ධර්ම එක්වීමේ ගුණාත්මක වෙනසක් සිදු වෙයි. ඒ සඳහා පදනම වන්නේ උත්සදභාවය නමින් හැඳින්වෙන නෙරාසිටීම හෙවත් අධිකත්වයයි. රූප ධර්මයන්ගේ උත්සදභාව පිළිබඳ විග්‍රහ කරන විශුද්ධි මාර්ගය භූතාවේශ පුද්ගලයන් නිදසුන් ලෙස ගෙන දක්වයි. (ධම්මරක්ඛිත හිමි, 2004: 30-45) ආවේශ වූ භූතයා එහි පුද්ගලයන් අභ්‍යන්තරයෙහි හෝ බාහිරව හෝ අසවල් තැන සිටී යයි කිව නොහැකිය. සතර මහා භූතයන් ද එලෙසමය. වෙන් වෙන්ව නොසිටින නමුත් වෙන්කොට හඳුනාගත නොහැකිය. නාම ධර්ම සංයෝගය දැක්වීමට සංසට්ඨ යන පදය ද රූප ධර්ම සංයෝගය දැක්වීමට අවිනිබ්භෝග යන පදය ද යොදා ගනී. ඉන්ද්‍රිය සංජානන ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු දක්වන සූත්‍ර අතර මධුපිණ්ඩික සූත්‍රය හා මහාහත්ථිපදෝපම සූත්‍රය වැදගත් වේ.

බුදුදහමේ ඉගැන්වීම්වලට අනුව ඉන්ද්‍රියයන් හයක් පවතින බව පෙනේ. මනස ද ඉන්ද්‍රියයක් ලෙස සලකා ඇති බව පෙනේ. ඉන්ද්‍රිය හය තුළින් අරමුණු ලබා ගන්නා අතර එහි දී මූලික වශයෙන් ඉන්ද්‍රිය සංවේදනයට අදාළ දැනීම ඇති වෙයි. බාහිර පරිසරයේ අරමුණු මෙම ඉන්ද්‍රියයන් හරහා ලබාගනී. මානසික අංශය ද ඉන්ද්‍රිය ඥාන ක්‍රියාවලිය හා සම්බන්ධ විය යුතුමය. එය පිළිබඳ සිතුවිලි ගොඩනගා ගනී. පඨවිය හෙවත් තද ගතියෙන් බැහැරව අනෙක් වස්තූන් ද සංසන්දනාත්මකව බලමින් සිතිවිලි විතර්ක ගොඩනගයි. ඉන් සතුටට පත් වී පරිකල්පනය සිදු කරන ආකාරය ආකාර පහකින් එහි දක්වා ඇති බව පෙනේ.

01. විෂය වස්තුව තත්ත්වය වශයෙන් පවතී යැයි පරිකල්පනය කිරීම (පඨවි මඤ්ඤති)

02. විෂය වස්තුව තුළ සාරයක් ඇතැයි පරිකල්පනය කිරීම (පඨවියා මඤ්ඤති)

03. එම විෂය වස්තුව සාපේක්ෂව ඉන් බැහැරව වස්තු පවතී යැයි පරිකල්පනය කිරීම (පඨවිතව මඤ්ඤති)

04. එම විෂය වස්තුව තමන්ගේ යැයි හැඟීම (පඨවිමේ අතිමඤ්ඤති)

05. විෂය වස්තුව පිළිබඳව ඇලීම හෝ එයට ප්‍රතිවිරුද්ධ ගැටීම් ගොඩනැගීම (පඨවේති අභිනන්දති) (මහානාම හිමි, 2010, පිටුව)

පඨවියා යන්න පෘථිවිය යන අර්ථයෙන් මෙන්ම ඉන්ද්‍රියයන්ට හසුවන ඕනෑම භෞතික වස්තුවක් යන අර්ථයෙන් භාවිත කළ හැකිය. පෘථග්ජනයා සියලු ඉන්ද්‍රිය අත්දැකීම් පවතින ආකාරයෙන් ම පවතී යයි සංජානනය කරන අතරෙහි වෙනස් වන සුළු ස්වභාවය නොදනී. අංග කොටස් කර බැලීමේ දී එවැනි වස්තුවක් නොපවතින බව නොදකී. පෘථග්ජනයා ඉන්ද්‍රිය අත්දැකීම් සංජානනය කිරීමෙන් ඒ පිළිබඳව ප්‍රපඤ්ච ගොඩනැගීමක් සිදුවන අතර එහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයා ඉන්ද්‍රිය අත්දැකීම් පිළිබඳ චිත්ත වේගාත්මක ප්‍රතිචාර දක්වයි. මෙම ඉන්ද්‍රිය තොරතුරු සකස් කිරීමේ ක්‍රියාවලිය හරහා පුද්ගලයා ප්‍රජානන ඇති කරගන්නා ආකාරය සූත්‍ර පිටකාගත කරුණු මඟින් හඳුනාගත හැකිය. මජ්ඣිමනිකායේ මහා වේදල්ල සූත්‍රයෙහි අනෙකුත් ඉන්ද්‍රියයන් මගින් ඒ ඒ ඉන්ද්‍රියයන්ට ආවේනික ගෝචර විෂයන් වළඳන නමුත් මනස ඒ සියලු ඉන්ද්‍රිය අත්දැකීම් වළඳයි. (මහානාම හිමි, 2010, පිටුව) මේ අනුව ඉන්ද්‍රිය පිළිබඳ පුළුල් අවබෝධයක් මෙන්ම අභිධර්මයෙහි ඉන්ද්‍රිය සම්බන්ධව එන ඉගැන්වීම් උගත හැකි වේ.

## සමාලෝචනය සහ නිගමනය

බුදුදහමේ ඇතුළත් විශේෂ ඉගැන්වීමක් ලෙස 'ඉන්ද්‍රිය' පෙන්වා දිය හැක. තමා හා සම්බන්ධ ධර්මයන් කෙරෙහි අධිපතිකම පවත්වන දේ (ධර්මයෝ) ඉන්ද්‍රිය නම් වෙති. බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වලින් නිර්දේශිත පරම නිෂ්ටාව වන නිර්වාණය අවබෝධ කිරීම සඳහා ඉන්ද්‍රිය සංවරය නැතහොත් දමනය අත්‍යවශ්‍ය වෙයි. එසේම සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රියයන් වැඩිය යුතුය. පුද්ගලයාගේ ලෞකිකත්ත්වය කෙරෙහි ඍජුව බලපාන සංකල්පයකි ඉන්ද්‍රිය. අභිධර්මයෙහි ඉන්ද්‍රිය සම්බන්ධ විග්‍රහ රාශියක් වෙයි. බුදුසමයෙන් අපේක්ෂා කරන්නේ ලෞකික ලොකෝත්තර උභයාර්ථ සාධනයයි. පඤ්චස්කන්ධය යනු සත්ත්වයායි. යථාභූත ඥානය හෙවත් නිවන ඉන්ද්‍රිය ඥානය ඉක්මවා ගිය උසස් ඥාන ශක්තියක් මඟින් අවබෝධ කොටගත හැකි බව නිගමනය කළ හැකි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


ඉන්දානන්ද, බඩිලිව්. (සංස්.) (2010-2011). *විදුසරණි ශාස්ත්‍රීය සංග්‍රහය*. දෙවන කලාපය. පේරාදෙණිය: සාමූහික භික්ෂු සංගමය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

ගුණසේකර, ඩී. (2000). *මනෝවිද්‍යාවේ ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය*. කොළඹ: ජාතික පර්යේෂණ මධ්‍යස්ථානය.

ජයතිලක, පී. (1982). *මනෝසංවේදන විග්‍රහය*. මොරටුව: සරසවි ප්‍රකාශන.

ද සූසා, ජී. ආර්. එන්. (1975). *සංවේදනාත්මක මනෝවිද්‍යාව*. කොළඹ: විශ්වවිද්‍යාලය.

දිසානායක, ඒ. (2018). *පංච ඉන්ද්‍රිය සහ ආගමික ක්‍රියාකාරීත්වය*. කොළඹ: විශ්වවිද්‍යාල ප්‍රකාශන.

*පුග්ගල පඤ්ඤත්තිප්පකරණය*. (1883). ලන්ඩන්: පාලි ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය.

පෙරේරා, අ. (1990). *බෞද්ධ චින්තනයේ සංවේදන තත්ත්වය*. පේරාදෙණිය: කුමාරි ප්‍රකාශන.

බණ්ඩාර, ජේ. (2005). බෞද්ධ භාවනාව සහ සංවේදන. මහනුවර: භාෂා ප්‍රකාශන.

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. (2005). *කථාවත්ථුප්පකරණය*. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. (2005). *ධම්මසංගණිප්පකරණය*. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. (2005). *ධම්මසංගණී අටුවාව*. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. (2005). *ධාතුවංසප්පකරණය*. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. (2005). *පට්ඨානප්පකරණය*. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*යමකප්පකරණය*. (1897). ලන්ඩන්: පාලි ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය.

රණසිංහ, ඩී. එස්. (1995). ඉන්ද්‍රිය සම්පත සහ ආයුර්වේදය. ගම්පහ: සනසුමා ආයුර්වේද පර්යේෂණ මධ්‍යස්ථානය.

විජේවර්ධන, ඒ. (2015). *ඉන්ද්‍රිය විශ්ලේෂණය සහ මනෝවිද්‍යාව*. කළුතර: රිවර් ප්‍රකාශන.

විභංගප්පකරණය. (1886). ලන්ඩන්: පාලි ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය.

සුඤ්ඤ කථා වර්ණනාව. (2013). *පරමත්ථ අටුවාව*.

හෙට්ටිආරච්චි, ඩී. (2006). *බෞද්ධ මනෝවිද්‍යා ප්‍රවේශය*. කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම.

Anderson, B. (2010). *Sensory and Perceptual Psychology*. Los Angeles, USA: Prentice Hall.

Haley, M. (2015). *Inner Senses: Reality and Mind models*. Tokyo, Japan: International Publications.

Monroe, A. (2022). *Senses and Social Connections*. Toronto, Canada: Routledge Publications.

Neisser, U. (1998). *Cognitive Psychology*. Cambridge, USA: Cambridge University Press.

Norman, R. (1982). S*ensory Physiology*. New York, USA: Oxford University Press.

Rocks, D. (2020). *The World of the Five Senses*. Berlin, Germany: Wiley Publication.

Seagerl, J. (1967). *The Psychology of Sense Perceptio*n. London, England: Macmillan Publishers.

Sreenath, A. (2019). *Sensory Functions in Religious Practice*. Mumbai, India: University Publications.

Stevens, R. (2018). T*he Five Senses and Psychology*. Sydney, Australia: Springer Science.

Waters, D. (2001). *Extra-Sensory Perception: A new Perspective*. Seattle, USA: Harper & Row